**පළාත් පාලන සේවා වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදල**

---

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 1.2 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2011 දෙසැම්බර් 31 දිනට පළාත් පාලන සේවා වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදලේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා උරන්නා වූ මතය වේ.

### 1.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම.

#### 1.2.1 ගිණුම්කරණ අඩුපාඩු

සමාලෝචිත වර්ෂයේ අරමුදලේ සමස්ථ විශ්‍රාම වැටුප් වියදම ගණනය කර ආදායම් වියදම් ගිණුමට ගලපා නොතිබුණි.

#### 1.2.2 පැහැදිලි නොකළ වෙනස්කම්

විගණනයට ඉදිරිපත්කළ තොරතුරු අනුව සමාලෝචිත වර්ෂයේ අරමුදලේ විශ්‍රාම වැටුප් වියදම රු.3,196,199 ක් වුවද විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තු පරිඝනක දත්ත පද්ධතියේ වියදම් වර්ගීකරණයට අනුව සමාලෝචිත වර්ෂයේ විශ්‍රාම වැටුප් වියදම රු.60,249,892 ක් වූයෙන් රු.57,053,693 ක නොසැසඳීමක් අනාවරණය විය.

#### 1.2.3 නීති,රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම.

විගණනයේදී නිරීක්ෂණය වූ අනුකූල නොවීම් පහත දැක්වේ.

| නීති,රීති, රෙගුලාසි යනාදියට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| ------------------------------------ | ----------------- |

| | | |
|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා ජනරජයේ මුදල් රෙගුලාසි 446(2) | මුදල් රෙගුලාසි ප්‍රකාරව මුදල් පොත විධිමත්ව පවත්වා නොතිබුණි. |
| (ආ) | 2006 දෙසැම්බර් 22 දිනැති අංක පීඑෆ්/423 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය | |
| | i. 4.1(අ) ඡේදය | සමාලෝචිත වර්ෂයේ අයවැය ලේඛනය විෂයභාර අමාත්‍යවරයා විසින් අනුමතකර නොතිබුණි. |
| | ii. 4.3(ඇ) ඡේදය | සමාලෝචිත වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශය මූල්‍ය ප්‍රකාශන සමඟ ඉදිරිපත් කර නොතිබුණි. |
| (ඇ) | 2010 දෙසැම්බර් 13 දිනැති අංක 12/2010 දරන විශ්‍රාම වැටුප් චක්‍රලේඛයේ 2(IV) ඡේදය | අරමුදලේ මාසික වියදම් පිළිබඳ ඒකාබද්ධ වාර්තා දිස්ත්‍රික් ලේකම් කාර්යාල වලින් විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව වෙත ගෙන්වාගෙන නොතිබුණි. |

2. <u>මූල්‍ය සමාලෝචනය.</u>

1.2 <u>මූල්‍ය ප්‍රතිඵල</u>

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, සමාලෝචිත වර්ෂය සඳහා අරමුදලේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.37,137,830 ක අතිරික්තයක් වූ අතර, ඊට අනුරූපව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.42,858,914 ක් වුයෙන්, මූල්‍ය ප්‍රතිඵලයේ රු.5,721,084 ක පිරිහීමක් පෙන්නුම් කෙරිණි.ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ පොලී අනුපාත අඩුවීම මත පොලී ආදායම රු.2,892,308 කින් අඩුවීමත්,ආයෝජන කල් පිරීමේ ප්‍රාග්ධන ලාභ රු.2,909,959 කින් අඩුවීමත් මූල්‍ය ප්‍රතිඵලය පිරිහීමට ප්‍රධාන වශයෙන් ඉවහල්වී තිබුණි.

3. **මෙහෙයුම් සමාලෝචනය**

--------------------------

3.1 <u>කාර්ය සාධනය</u>

1985 අංක 10 දරන පළාත් පාලන සේවා (සංශෝධන) පනතේ 14 වගන්තියට අනුව, මුල් ප්‍රඥප්තියේ 16.අ.(2)(1) ලෙස ඇතුලත් වගන්තිය ප්‍රකාරව උක්ත අරමුදලේ පාලනය විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාල්වරයා සතුබව සඳහන්ව ඇතත් පනතේ නියෝගයන්ට පටහැනිව 2010 දෙසැම්බර් 13 දිනැති

අංක 12/2010 දරන විශ්‍රාම වැටුප් චක්‍රලේඛය මගින් අරමුදලේ මාසික වැටුප් ලේඛන පිළියෙල කිරීම හා ලිපි ගොනු වල භාරකාරත්වය 2011 ජනවාරි 01 දින සිට ප්‍රාදේශීය ලේකම්වරුන් වෙත විමධ්‍යගත කර තිබුණි.

3.2 <u>මූල්‍ය කළමනාකරණ දුර්වලතා</u>

අරමුදල සතු අතිරික්ත මුදල් ආයෝජනය කිරීමේදී 2008 මාර්තු 03 දිනැති අංක 1/2008 දරන භාණ්ඩාගාර මෙහෙයුම් චක්‍රලේඛයෙන් අනුමතකර ඇති ආයෝජන මූලාශ්‍ර වන ස්ථාවර තැන්පතු හා භාණ්ඩාගාර බැඳුම්කරවල අපේක්ෂිත ප්‍රතිලාභ ඇගයීමෙන් අරමුදලට වාසිදායී ආයෝජන තීරණය කිරීම කෙරෙහි අවධානය යොමු නොකර රු42,499,638 ක් භාණ්ඩාගාර බැඳුම්කරවල පමණක් ආයෝජනය කර තිබුණි.

4. **පද්ධති සහ පාලනයන්**

-----------------------

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු පිළිබඳව වරින් වර විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාල්වරයා දැනුවත් කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතු වේ.

(අ) ගිණුම්කරණය

(ආ) වියදම් වාර්තා

(ඇ) ආයෝජන